## කලා ශ්‍රව්‍ය/ දෘෂ්‍ය වීඩියෝ තාක්ෂණය, සහ සන්නිවේදන ක්ෂේත්‍රය
## (Arts, Audio/ Video Technology and Communication Sector)

ඔබ ප්‍රේක්ෂකයින් ඉදිරියේ රඟපාන්න කැමතිද ? ඔබ යමක් ඇසීමෙන් සහ දැකීමෙන් සතුටට පත්වන්නේ ද? ඔබ සන්නිවේදන තාක්ෂණ මෙවලම් සමග වැඩ කිරීමට කැමතිද ?

කලා, ශ්‍රව්‍ය/ දෘෂ්‍ය තාක්ෂණය සහ සන්නිවේදන කේෂත්‍රයේ පුද්ගලයෝ රැකියාවේ දී නිර්මාණශීලීත්වය සහ ඔවුන්ගේ දක්ෂතා භාවිත කරති. ඔබට රංගන ශිල්පියෙකු හෝ කලාකරුවෙකු ලෙස ප්‍රේක්ෂකයන් සඳහා වැඩ කළ හැකි ය. මෙයට චිත්‍ර ශිල්පීන් නර්තන ශිල්පීන්, මූර්ති ශිල්පීන්, නළුවන් හා ගායකයන් ඇතුළත් වේ. නැත හොත් කාර්ය සාධනයක් සාර්ථක කර ගැනීමට ඔබ තිරය පිටුපස සිට වැඩ කළ හැකි ය. මෙයට කට්ටල නිර්මාණ කරුවන්, සංස්කාරකවරුන්, විකාශන ශිල්පීන් සහ කැමරා ක්‍රියාකරුවන් ඇතුළත් වේ.

සමහර ශ්‍රව්‍ය/ දෘශ්‍ය තාක්ෂණ සහ සන්නිවේදන සේවකයන්ට උසස් රැකියා ඇත. උදාහරණ වශයෙන් ඔබට ප්‍රවෘත්ති වාර්තාකරුවෙකු හෝ විලාසිතා නිර්මාණකරුවෙකු ලෙස වැඩ කළ හැකි ය. එසේ නැතිනම් ඔබ ඔබේ නිර්මාණාත්මක කුසලතා තාක්ෂණය සමඟ භාවිත කර සජීවිකරණ ශිල්පියෙකු, ග්‍රැෆික් නිර්මාණ හෝ චිත්‍රපට සංස්කාරවරයෙකු ලෙස වැඩ කළ හැකි ය.

**කලා ශ්‍රව්‍ය/ දෘෂ්‍ය වීඩියෝ තාක්ෂණය, සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ රැකියා/ වෘත්ති,**

**1. නළු/ නිළි**
රූපවාහිනය, ගුවන් විදුලි හෝ වේදිකා නිෂ්පාදනවලට සහභාගි වන්නා.

**2. කලාකරුවන් රංගන ශීල්පීන් සම්බන්ධීකාරක**
කලාකරුවන් රංගන ශිල්පීන්ගේ සමබිනධීකරණ කටයුතු සිදු කිරීම

**3. කලා අධ්‍යක්ෂ**
මුද්‍රණ, විකාශය හෝ ප්‍රචාරණය වැනි දෘශ්‍ය සන්නිවේදන මාධ්‍ය මත වැඩ කරන්නා.

**4. ශ්‍රව්‍ය/ දෘශ්‍ය උපකරණ කාර්මික ශිල්පී**
ප්‍රසංග, ක්‍රීඩා ආදී කටයුතුවල ශ්‍රව්‍ය හා දෘශ්‍ය උපකරණ ක්‍රියාත්මක කරන්නා.

**5. පුවත් වාර්තාකරු**
ප්‍රවෘත්ති සිදුවීම් විශ්ලේෂණය කිරීම අර්ථ නිරූපණය කිරීම සහ වාර්තා කිරීම.

**6. විකාශන ශිල්පී**
ගුවන්විදුලි සහ රූපවාහිනි වැඩසටහන් සම්ප්‍රේෂණය කරන උපකරණ ක්‍රියාත්මක කිරීම.

**7. කැමරා ක්‍රියාකරු**
තොරතුරු වාර්තා කිරීමට, රූපවාහිනිය වීඩියෝ හෝ චිත්‍රපට කැමරා ක්‍රියාත්මක කරන්නා.

**8. නර්තන ශිල්පී**
කතන්දර සහ අදහස් ප්‍රකාශ කිරීමට චලනයක් භාවිත කරමින් නව නර්තන ක්‍රම සාදන්නා.

**9. විලාසිතා සහායක**
විනෝදනාස්වාදය කරන්නන් සඳහා ඇඳුම් තෝරන්නා/ ගළපන්නා සහ රැක බලා ගන්නා

**10. හස්ත කලා ශිල්පීන්**
රෙදි විවීම, ඉදිකටු හෝ මැටි භාණ්ඩ වැනි අතින් සාදන ලද වස්තූන් සාදන්නා.

**11. නර්තන ශිල්පි**
ප්‍රසංග, අදහස් සහ කථා ප්‍රකාශ කිරිමට චලනභාවිත කරන්නා.

**12. සංස්කාරක**
ලිඛිත ද්‍රව්‍යවල අන්තර්ගලය සැලසුම් කිරීම හෝ සංස්කරණය කිරීම.

**13. විලාසිතා නිර්මාණකරු**
ඇඳුම් සහ විලාසිතා සැලසුම්කරන්නා

**14. චිත්‍රපට සහ විඩීයෝ සංස්කාරකවරු**
සම්පූර්ණ නිෂ්පාදනයක් බවට වීඩියෝ දර්ශන සංවිධානය කර එකට එකු කරන්නා.

**15. මල් නිර්මාණකරුවන්**
මල් කළඹ සැලසුම් කිරීම සහ සකස් කිරීම.

**16. ග්‍රැෆික් නිර්මාණකරු**
නිෂ්පාදනයක් හෝ සේවාවක් ප්‍රවර්ධනය කිරීම සඳහා චිත්‍රක නිර්මාණය කිරීම සහ සැලසුම් කිරීම.

**17. බහුමාධ්‍ය කලාකරුවන් සහ සජීවී ශිල්පීන්**
චිත්‍රපට, විඩියෝ, පරිගණක හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික මෙවලම් භාවිතයෙන් විශේෂ ප්‍රයෝග හෝ සම්බන්ධීකරණය කරන්නා.

**18. සංගීත අධ්‍යක්ෂක සහ තනු නිර්මාණය කර්න්නා.**
ගීතයට/නාට්‍යක/ චිත්‍රපටයක් සඳහා සංගීතය සැපයීම හෝ තනු නිර්මාණය කිරීම.

**19. ඡායාරූප ශිල්පී**
විවිධ පරිසර දර්ශන සහ වෙනත් දර්ශන ඡයාරූපයට නගන්නා

**20. මුද්‍රණාල ක්‍රියාකරුවන්**
මුද්‍රණ යන්ත්‍ර උපකරණ ක්‍රියාත්මක කිරීම.

**21. ගුවන් විදුලි හා රූපවාහිනි නිවේදකයන්**
ගුවන් විදුලියේ හෝ රූපවාහිනයේ කතා කරන්නා. ප්‍රෙක්ෂකයන්ට ප්‍රවෘත්ති ක්‍රිඩා හෝ සංගීත ඉදිරිපත් කිරීම් කරන්නා.

**22. වාර්තාකරු**
ප්‍රවෘත්ති ආයතන සඳහා කථා වාර්තා කර ලිවීමෙහි යෙදීම.

**23. ප්‍රදර්ශන සැලසුම් කිරීම හා නිර්මාණ කරන්නා**
විශේෂ චිත්‍රපට රූපවාහිනි සහ රංගශාලා කට්ටල හෝ වෙනත් විශේෂ ප්‍රදර්ශන සැලසුම් කිරීම.

**24. ශබ්ද ඉංජිනේරු තාක්ෂණ ශිල්පී**
ශබ්ද පටිගත කිරීම, මිශ්‍ර කිරීම සඳහා උපකරණ ක්‍රියාත්මක කිරීම.

**25. විදුලි සංදේශ උපකරණ ස්ථාපකයන් සහ අලුත්වැඩියා කරන්නා**
දූරකථන කේබල් අන්තර්ජාලය වෙනත් සන්නිවේදන උපකරණ ස්ථාපනය කිරීම හා අලුත් වැඩියා කිරීම.

**26. වේෂ නිරූපණ ශිල්පී**
රංගන කාර්මික ශිල්පින්ට මේකප් යොදන්නා.

**27. ලේඛක**
පොත් ලිපි ද්‍රව්‍ය ලිවීමෙහි යෙදීම